# ලෝක ගෝල පාපන්දු හා ගැලීලියෝ එල්ලා මැරීම

ලෝක පාපන්දු කුසලාන සඳහා අවසන් තරගය පැවැත්වුණේ ස්පාඤ්ඤය හා නෙදර්ලන්තය අතර ය. නෙදර්ලන්තය අප රටේ මුහුදුබඩ පෙදෙස් යටත්කරගෙන සිටි රටකි. එකල ඒ රට හැඳින්වූයේ ඕලන්දය නමිනි. ස්පාඤ්ඤය අප යටත්කරගෙන නොසිටියත් පෘතුගාලය අපේ මුහුදුබඩ පෙදෙස් පාලනය කෙළේ ය. පාප් වහන්සේ පහළොස්වැනි සියවසේ ලෝකය ස්පාඤ්ඤය හා පෘතුගාලය අතර බෙදාදුන්නේ ය. බැරි වෙලාවත් පාප් වහන්සේ ඒ බෙදාදීම මාරු කෙළේ නම් අප රට යටත්කරගැනීමට පළමුව එමට තිබුණේ ස්පාඤ්ඤය ය. එසේ වී නම් ලෝක පාපන්දු කුසලාන අවසන් තරගය අපට තවත් වැදගත් වීමට තිබිණි! ලෝකය ද පාපන්දුව මෙන් නොවුවත් ආසන්න වශයෙන් ගෝලාකාර වෙයි. බටහිරයන්ට ලෝක ගෝලය ද පාපන්දුවකි.

ලෝක ගෝල පාපන්දු කුසලානේ තරග විනිසුරු පාප් වහන්සේ යැයි මම නො කියමි. එතුමා ලෝක ගෝලය ස්පාඤ්ඤය හා පෘතුගාලය අතර බෙදා දුන්නත් අද වන විට එතුමාට අයිති වී ඇත්තේ රෝමය අසළ පිහිටියේ යැයි කිවහැකි ඉතා කුඩා කොටසක් වූ වතිකානුව පමණකි. ස්පාඤ්ඤය හා පෘතුගාලය කතෝලික රටවල් වුවත් ඒ රටවල් ලෝක ගෝලයට ගෙන ගියේ වෙනත් චින්තනයකි. ඔවුන් හෝ පාප් වහන්සේ හෝ දහහත්වැනි සියවසේ ලෝක ගෝලයට ඊනියා විද්‍යාත්මක පරීක්ෂණ ක්‍රමය හඳුන්වා දුන්නේ යැයි කියන කතෝලිකයකු වූ ගැලීලියෝ ගැලීලිවත් තමන් කතෝලික නොවන චින්තනයක් වෙනුවෙන් පෙනී සිටින බව නොදැන සිටින්නට ඇත.

පසුගිය දා එක් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යාවක් විසිඑක්වැනි සියවසේ ගැලීලියෝ මැරීම යන මැයෙන් කතාවක් කළා ය. ඒ කතාව අසාගෙන සිටි මට තවමත් අපට ගැලිලියෝ මරාදැමීමට නොහැකි වීම ගැන ඇතිවූයේ කණගාටුවකි. මම නම් මගේ දේශනවල දී හැකි සෑම අවස්ථාවක ම ගැලීලියෝ පමණක් නොව නිව්ටන් හා අයින්ස්ටයින් ද මරා දැමීමට උත්සාහ දරමි. එහෙත් බොහෝ විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හැකි නම් මා මරා දමනු ඇත. මට තවමත් ඉහත කී අය මරා දැමීමට නොහැකි වී ඇත. සරසවි සිසු සිසුවියන්ට පමණක් නොව ඔවුන්ගේ ලාංකේය වීරයන්ට ද තවමත් මා මරා දැමීමට ද නොහැකි වී ඇත.

ඉහත සඳහන් කරන ලද කතාවෙන් දින කිහිපයකට පෙර එවැනි එක් වීරයකු කළ කතාවකට ද සවන් දීමට මට සිදු විණි. ඔහු තමා ගැලීලියෝගේ හා අනෙක් බටහිර විද්‍යාඥයන්ගේ ඊනියා විද්‍යාත්මක ක්‍රමය අනුගමනය කරන්නකු යැයි කියයි. ඔහුට අනුව මෙරට නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් කියැවෙන නම් පහකි. ඒ කන්නන්ගර, ඇතුළත්මුදලි, ඩොනමෝර්, ඔහුගේ කොමිසමේ අනෙකා (බටහිරයන්ගේ කසිකබල් පශ්චාත්නූතනවාදි විකාර අරුතින් නොවේ) වූ ඩ්‍රමන්ඩ් හා සිඩ්නි වෙබ් ය. අවසාන නම් තුන නිදහස් අධ්‍යාපනයට අදාළ වන්නේ ඔවුන් තිදෙනා අප රටට සර්වජන ඡන්දය ලබාදීමේ දී මූලික වූ බැවින් යැයි ඔහු කියා සිටියේ ය. කතාව අවසානයේ දී ඔහු මගෙන් කතාවේ අඩුපාඩු ගැන විමසුවේ ය. මම ඔහුගෙන් එක් ප්‍රශ්නයක් පමණක් ඇසීමි. සර්වජන ඡන්දය ලබා දී ඇති අනෙක් රටවල නිදහස් අධ්‍යාපනය තිබේ ද යන්න ය. ඔහු එයට පිළිතුරු වශයෙන් කීවේ අමෙරිකානුවන් ඒ ලබාගැනීමට නොදන්නා බව ය! ඒ පිළිතුර සමග අයින්ස්ටයින් තබා ගැලීලියෝවත් එකඟ නොවන බව නම් මම දනිමි.

අපේ තරුණ ශිෂ්‍යාවන් පමණක් නොව මහළු ගුරුවරුන් ද සිතන්නේ එවකට සිටි පාප් වහන්සේ ගැලීලියෝට වස පානය කිරීමට නියම කෙළේ ගැලීලියෝ සත්‍යය වෙනුවෙන් පෙනී සිටි නිසා බව ය. තම තමන්ගේ න්‍යාය පත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා ඒ ඒ අය විසින් සත්‍යය තරමට පට්ටා ගසනු ලබන තවත් වචනයක් නැත. ගැලීලියෝ පොළොව ඉර වටා යන බව ඉගැන්වීය. ඒ ඔහු ඉතාලියට පැමිණ කතෝලික පූජකවරයකු වීමට ඉගෙන ගත් පෝලන්තයේ කොපර්නිකස්ගෙන් දැනගත් කරුණකි. කොපර්නිකස් ඒ බව ඉගෙන ගත්තේ කාගෙන් දැයි දැනගැනීමට නැත. සුපුරුදු ආකාරයට බටහිර විද්‍යාවේ ඉතිහාසඥයෝ සත්‍යයේ නාමයෙන් ඒ බව මුලින් ම දැනගැනීමේ ගෞරවය කොපර්නිකස් ට දෙති. බටහිරයන් සත්‍යය එල්ලා මරන්නේ යැයි මම නො කියමි. එල්ලා මැරීමටවත් සත්‍යයක් නැත.

කොපර්නිකස්ට බොහෝ කලකට පෙර භාරතයේ නක්ෂත්‍රවේදීහු පොළොව ඉර වටේ යන බව දැන සිටියහ. ඒ භාවනාවෙන් ලබාගත් දැනුමක් විය හැකි ය. කොපර්නිකස් ඒ බව දැනගත්තේ භාරතයෙන් දැයි නිශ්චිතව කීමට නො හැකි ය. මෙහි දී කරුණු දෙකක් අවධාරණය කළ යුතු ය. එකක් නම් භාරත නක්ෂත්‍රවේදීන් ඒ බව දැනගත්තත් ඔවුන්

© Prof. Nalin De Silva

ඒ බව තම ශිෂ්‍යයන්ට ඉගැන්වුවත් කිසිවකු ඔවුන්ට වස නොදීමත් ඔවුන් ඒ ගැන මහා ආන්දෝලනයක් ඇති නො කිරීමත් ය. විශ්වය ප්‍රසාරණය වන්නේ යැයි කී එඩ්වින් හබල් ගැන බටහිර විද්‍යාඥයෝ කොපමණ කතා කරත් ද? එහෙත් විශ්වයේ සංවට්ට කප්ප විවට්ට කප්ප ගැන අවුරුදු දහස් ගණනකට පෙර දැන සිටි බෞද්ධයන් ගැන කතා කරන්නෝ වෙත් ද? සංවට්ට කප්ප විවට්ට කප්ප ඇසුරෙන් විශ්වය පිළිබඳ ආකෘතියක් අපි කැලණිය විශ්වවිද්‍යාලයේ සකස් කෙළෙමු. ඒ පිළිබඳ ව මා කළ කතාවක් අසන්නට බෞද්ධ විශ්වවිද්‍යාලයක් යැයි කියන අප විශ්වවිද්‍යාලයේ විසිපස් දෙනකුවත් පැමිණියේ නැත. බැරි වෙලාවත් මැවුම් කරුවකු නොමැතිව ද මැවීමක් ගැන කතාකිරීමට මග සැලසූ හබල් වලෙන් නැගිට පැමිණියහොත් බෞද්ධ විශ්වවිද්‍යාලයෙන් ඉතා වැඩි පිරිසක් ඔහුට සවන්දීමට පැමිණෙනු ඇත. මෙරට පුවත්පත් හා අනෙක් ජනමාධ්‍යය ද සති ගණනක් ඒ ගැන කතාකරනු ඇත. හබල් මරා දැමීමට උත්සාහ කරන මා මරා දැමීමට තැත්කරන සිසුන් මට සවන්දීමට පැමිණෙතැයි බලාපොරොත්තු නොවිය හැකි ය.

අවධාරණය කළ යුතු දෙවැනි කරුණ වනුයේ භාරතීය නක්ෂත්‍රවේදීන් පොළොව ඉර වටා යන බව ද දැන සිටි නමුත් ඉර පොළොව වටා යන බවට ඇති දැනුම ප්‍රතික්ෂේප නොකළ බව ය. ඔවුහු ජ්‍යොතිෂයෙහි ඒ දැනුම නොපැකිළව යොදාගත්හ. මා සිතන අයුරින් ඔවුන් පොළොවේ සිට බැලූ විට ඉර පොළොව වටේ යන්නා සේ පෙනෙන බවත් හැකි නම් ඉරේ සිට බැලූ විට පොළොව ඉර වටේ යන අයුරින් පෙනෙන බවත් දැන සිටින්නට ඇත. කෙනකුට අවශ්‍ය නම් හඳේ සිට බැලූ කල පොළොව (ලෝක ගෝලය) ගමන් කරන්නේ කෙසේ දැයි කල්පනා කළ හැකි ය. ඒ ඒ පුද්ගලයාට පෙනේනේ එකම අයුරින් නොවුවත් බටහිරයෝ එසේ පෙනෙන්නේය යන්න ඊනියා සත්‍යයක් බවට පත්කළහ. එසේ කිරීමේ ආරම්භය ඉතාලියේ ඊනියා පුනරුදයෙහි දැකිය හැකිවුවත් ඒ තහවුරු කෙළේ ගැලීලියෝ ය. පොළොව ඉර වටා යන බව එක ම සත්‍යය බවට පත්කිරීමට ඔහු ක්‍රියා කෙළේ ය. පාප් වහන්සේ ඔහුට වස දී ඔහු ඊනියා සත්‍යයේ පූජ වීරයකු බවට පත්කෙළේ ය. ඒ වස කෝප්පයෙන් කතෝලික චින්තනය වෙනුවට ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට නව පණක් ලැබිණි. ලෝක ගෝලය ස්පාඤ්ඤයට හා පෘතුගාලයට බෙදාදුන් පාප් වහන්සේත් පසුව ගැලීලියෝට වස නියම කළ පාප් වහන්සේත් තමන් කතෝලික චින්තනයේ වල කපන බව නොදැන සිටියෝ ය.

පාප් වහන්සේ ගැලීලියෝ ට කීවේ පොළොව ඉර වටේ යන බව විශ්වාස නොකිරීමටවත් ඉර පොළොව වටේ යන බව විශ්වාස කිරීමටවත් නො වේ. එතුමා ඔහුට කියා සිටියේ පොළොව ඉර වටේ යන බව උගන්වන්නේ නම් පළමුව ඒ බව කරුණු සහිතව පෙන්වන ලෙස ය. එහෙත් ගැලීලියෝට ඒ කළ නොහැකි විය. එවිට පාප් වහන්සේ කියා සිටියේ එසේ නම් ඒ බව නුගන්වන ලෙස ය. ඒ බව විශ්වාස නොකරන්න යැයි එතුමා ගැලීලියෝ ට නොකී බව අවධාරණය කළ යුතු ය. එහෙත් ගැලීලියෝ දිගට ම තම ඉගැන්වීම කරගෙන ගියේ ය. එවිට පාප් වහන්සේට යම් පියවරක් ගැනීමට සිදුවිය. එයට පෙර සිට ම වස්කෝ ද ගාමාලාගේ කාලයේ සිට ම ලෝක ගෝලයට පයින් ගසමින් සිටි යුරෝපීයයෝ ඉන් පසුව හිතේ හැටියට ලෝක ගෝල පාපන්දු ක්‍රිඩාවේ යෙදුණහ. කොලම්බස් තම චාරිකාව ආරම්භ කෙළේ ද ලෝක ගෝලය ගෝලයක් ම බව කිසිදු සැකයකින් තොරව පෙන්වීමට ය. ගැලීලියෝ කොලම්බස්ගේ ගෝලය කැරකෙන ගෝලයක් බවට පත්කෙළේ ය. ලෝකයන් වූ බටහිරයෝ ඒ කැරකෙන ගෝලය තුළ හිඳිමින් ඔවුන්ගේ තාලයට බයිලා කියන්නට අප පුරුදු කළහ. ලෝකෙ නිකන් බෝලෙ වගේ කැරකෙනවා එකෙ ඇතුළෙ අපි ඉඳගෙන බයිලා කියනවා යන බයිලාවේ පද රචනය කාගෙ දැයි මම නො දනිමි. වෙනත් බොහෝ බයිලා කතුවරුනට රාජ්‍ය සම්මාන ලැබෙද්දී ඔහුට සම්මානයක් නොලැබුණේ ඔහු නොදැන වුවත් බටහිර චින්තනය හා සම්බන්ධ නොකිවයුතු යමක් කී නිසා ද?

ආධ්‍යාත්මික නොවන සංවර්ධනයක් පසුපස යන බටහිරයෝ අද තවත් බයිලාවක් කියති. ඒ ඉන්දියාව හා චීනය මේ සියවසේ ආර්ථික යෝධයන් වන බව ය. එහෙත් වැඩක් කෙරෙන අන්දමින් ඒ රටවලට යෝධයන් වීමට බටහිරයන් ඉඩ නොදෙනු ඇත. බටහිරයෝ ලෝකයෝ වෙති. කවුරු යෝධයන් වුවත් ලෝක ගෝල පාපන්දු ක්‍රීඩාවේ ගෝල් ලබන්නෝ බටහිරයෝ ය. යෝධයන්ට ද හැකි වන්නේ සංවර්ධනයෙන් ලබාගත් රූපවාහිනිවලින් නිදිමරාගෙන ඒ නැරඹීම පමණකි. අප සම්බන්ධයෙන් ද බටහිර සංවර්ධනය එලෙස ම වෙයි. එහෙත් අපට වෙනසක් කළ හැකි ය. අප ඊනියා කුඩා අඟුටුමිටි රටක් නො වේ. අපි ලෝක ගෝල පාපන්දු ක්‍රීඩාවට සහභාගි නො වෙමු. අපට ආසියාවේ ආශ්චර්යය පමණක් නොව ලෝකයේ ම පින්කෙත ද විය හැකි ය. එහෙත් එයට පළමු අප ගැලීලියෝ එල්ලා මැරිය යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva